විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
# மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
# PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வது மாடி, ஜன ஜய சிட்டி வளாகம், நாவல வீதி, ராஜகிரிய No.628,10th Floor, Jana Jaya City Building, Nawala Road, Rajagiriya

| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/EST02/01/SP(CLG) | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2024.09.09 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් (බ.ප.)
ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.)
පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

**<u>බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වල සේවයේ නියුතු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) I වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>**

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වල 2019 හා 2020 වර්ෂයන්හි බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) විශේෂ ශ්‍රේණියේ ඇතිවී ඇති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වල සේවයේ නියුතු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) I වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර එම නිවේදනය මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

02. අයදුම්පත් කැඳවීමේ නිවේදනය 2024.09.06 දිනැති පළාත් සභා ගැසට් නිවේදනය මගින් ගැසට් කර අතර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේද පළකර ඇත.

03. මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි. අදාල අයදුම්පත් එම නිවේදනය සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතුය.

04. සෑම අයදුම්පත්‍රයක්ම අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් <u>2024..09.27</u> දිනට හෝ ඊට පෙර ලැබෙන සේ " ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), අංක 628, 10 වන මහල, ජනජය සිටි ගොනැගිල්ල, නාවල පාර, රාජගිරිය " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ

05. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

011 2879614
ෆැක්ස් : 0112879512 – Ex: 511
ppscwpest@sltnet.lk


| ලේකම් / செயலாளர் / Secretary | සහකාර ලේකම් (කළමනාකරණ හා ප්‍රතිපත්ති) / உதவிச் செயலாளர் (நிர்வாகம் மற்றும் கொள்கைகள்) / Assistant Secretary (Management & Policies) | සහකාර ලේකම් (විභාග හා බඳවාගැනීම්) / உதவிச் செயலாளர் (பரீட்சைகள் மற்றும் ஆட்சேர்ப்பு) / Assistant Secretary (Examinations & Recruitment) | සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) / உதவிச் செயலாளர் (தாபனம் மற்றும் நிதி) / Assistant Secretary (Establishment & Accounts) | පරිපාලන නිලධාරි / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879614; ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512; ඊ-මේල් / ஈமெயில் / E-Mail: ppscwpse@sltnet.lk |
|---|---|---|---|---|---|
| 011 2879528 | 011 2879610 | 011 2879317 | 011 2879538 | 011 2879517 | |

සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI වන කොටසේ 2024 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,401 - 2024 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා - 2024.09.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 800 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 803 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 සැප්තැම්බර් මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 සැප්තැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

799 - B 082607 — 5,403 (2024/09)
F 1 -

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(2) උපවගන්තියට අනුව නිකුත් කරන දැන්වීම

පහත සඳහන් කර ඇති ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතිවල ඈවර කටයුතු අවසන් කර ඇති බව එම ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතිවල සියලුම සාමාජිකයින්ට, ණය හිමියන්ට හා ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57 (2) උපවගන්තියට අනුව මෙයින් දන්වා සිටිමි. පහත සඳහන් කර ඇති ලියාපදිංචිය අවලංගු කළ යම් සමුපකාර සමිතියකින් තමන්ට ලැබිය යුතු යම් හිමිකමක් තිබේ නම්, මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට මාස 3ක් ඇතුළත එම හිමිකම ඉල්ලා සිටීම සිදු කළ යුතු බවට ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට, ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතියේ සාමාජිකයින්ට හා ණය හිමියන්ට මෙයින් දන්වමි. මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කළ දිනයේ සිට මාස 03ක් ගත වූ පසු ඉදිරිපත් කරන කිසිම හිමිකම් කියාපෑමක් පිළිබඳව සලකා නොබලන බව ද දන්වා සිටිමි.

### ගැසට් කිරීමේ සමිති ලේඛනය

| *අනු. අංකය* | *සමිතියේ නම* | *ලියාපදිංචි අංකය* | *වසා දමන ලද දිනය* |
|---|---|---|---|
| | **කුරුණෑගල කොට්ඨාසය** | | |
| 1 | සීමාසහිත වැළඩගම දිරිය ශක්ති කෘෂිකාර්මික සමුපකාර සමිතිය | 1508/14 | 2022.02.28 |
| 2 | සීමාසහිත ඊරිමින්න සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | කු/1689 | 2022.03.16 |
| 3 | සීමාරහිත ගලබඩගම සියඹලාවැහැර සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | වප/ව/04 | 2022.03.16 |
| 4 | සීමාසහිත අලව්ව පොල් අතුරු භෝග නිෂ්පාදන අලව්ව පොල් ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිතිය | වප/අල/03 | 2022.07.11 |
| 5 | සීමාසහිත රිදීගම බටහිර සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | කු/1782 | 2022.08.10 |
| 6 | සීමාරහිත නෙළුම්පත් ගම සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | කු/1894 | 2022.10.07 |
| 7 | සීමාසහිත කලවානේගම ලියසෙවන කාන්තා සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | වප/කු/431 | 2022.12.06 |
| 8 | සීමාරහිත තණහේන සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | කු/2121 | 2022.12.13 |
| 9 | සීමාසහිත වල්පොල නිර්මාණී සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | වප/කු/596 | 2022.12.13 |
| 10 | සීමාරහිත පැල්ලන්දෙණිය සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | කු/867 | 2023.01.09 |
| 11 | සීමාරහිත මීතැන්වල ග්‍රාමාරක්ෂක සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | කු/302 | 2023.01.09 |
| 12 | සීමාරහිත අමුණුගම පළාතේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | වප/කු/වාරි/10 | 2023.01.09 |
| 13 | සීමාසහිත වයඹ ප්‍රවාහන සමුපකාර සමිතිය | කු/1904 | 2023.02.06 |
| | **කුලියාපිටිය කොට්ඨාසය** | | |
| 14 | සීමාරහිත ගල්ලැහැපිටිය සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | කුලි/353 | 2022.03.14 |

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) I වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල 2019 හා 2020 වර්ෂයන් හි බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) විශේෂ ශ්‍රේණියේ ඇති වී ඇති පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවලට අනුයුක්තව දැනට සේවයේ යෙදී සිටින හා විශ්‍රාම ලබා ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) I වන ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් කැඳවන අවසාන දිනය : **2024.09.27**

02. *බඳවා ගන්නා ආකාරය.-*

I. බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.06.24 දිනැතිව අනුමත කරන ලද 2013.06.01 වැනි දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 10.3.3 ඡේදයට අනුව උපලේඛන 06 සඳහන් නිර්ණායක යටතේ පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල අනුව හා අදාළ සෙසු අවශ්‍යතා සපුරා ඇති බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) විශේෂ ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

03. *මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය.-*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 - MN- 7 හි 04 වන වැටුප් පියවර,

රු. 41,580- 11 x 755 -18 x 1030 - රු. 68,425/-

04. *සුදුසුකම්.-*

*සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය :*

2019 වර්ෂයේ පුරප්පාඩු සඳහා අයදුම්පත් යොමු කරන අයදුම්කරුවන් 2018. 12. 31 දිනට ද,

2020 වර්ෂයේ පුරප්පාඩු සඳහා අයදුම්පත් යොමු කරන අයදුම්කරුවන් 2019. 12. 31 දිනට ද,

පහත සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

I. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ පාලන චක්‍රලේඛ 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. ( 2020 වර්ෂයේ උසස් වීම් සඳහා අදාළ වේ).

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

V. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම. (බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2013.06.01 දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. (බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පිටුව 08)

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්.-

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| සේවා පළපුරුද්ද :<br>I වන ශ්‍රේණියේ වසර හයක (06) සේවයට අමතරව ඇති සේවා වෙනුවෙන් එම අමතර වසරක් සඳහා ලකුණු 05 බැගින් ලබා දේ.<br>(පාලන චක්‍රලේඛ 01/2022 අනුව ලකුණු ලබා දෙනු ලැබේ.) | 50 | 50 | |
| කුසලතාවය : | | 45 | |
| කාර්ය සාධනය (ආසන්න වසර 05ක් සඳහා) - 15<br>විශිෂ්ට මට්ටම - 03<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - 02<br>සතුටුදායක මට්ටම - 01 | 15 | | |
| වෘත්තීය සුදුසුකම් : - 05 | 05 | | |
| සිවිල් ක්ෂේත්‍රයට අදාළව :<br>■ මාස 06ක් හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලා සහතිකයක් සඳහා - 05<br>■ මාස 06 අඩු ඩිප්ලෝමා පාඨමාලා සහතිකයක් සඳහා - 03 | | | අදාළ නොවේ |
| තොරතුරු තාක්ෂණ පාඨමාලා සහතිකයක් සඳහා - 02 | 02 | | |
| ව්‍යාපෘතියක්/ව්‍යාපෘති සාර්ථකව ඉටු කර ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිත වාර්තාමය ඉදිරිපත් කිරීමක් (ඉටු කිරීමේ දී පැවති ගැටළු, ඒවාට ලබාදුන් විසඳුම් ඇතුළත් විය යුතුය.) | 15 | | |
| සිවිල් ඉදිකිරීම් හා නඩත්තු සේවා කටයුතු ඉටු කිරීමේ දී දක්වන සක්‍රිය දායකත්වය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ආයතන ප්‍රධානියාගේ සහතිකය | 06 | | |
| ප්‍රශංසා හා ඇගයීම් | 02 | | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 | 05 | |
| එකතුව | 100 | 100 | |

06. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස් කිරීම සඳහා වන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව අපේක්ෂකයා විසින් ම නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කළ යුතුය.

07. සෑම අයදුම් පත්‍රයක් ම බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් මගින් 2024.09.27 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) විශේෂ ශ්‍රේණියේ තනතුරට උසස් කිරීම" ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

08. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

09. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.gov.lk යන නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2024 සැප්තැම්බර්මස 03 වැනි දින.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම (සේවා පළපුරුද්ද සහ කුසලතාවය මත)**

(නිලධාරියා විසින් සම්පූර්ණ කිරීම සඳහා)

1. නම (මුලකුරු සමග) : ..........
2. මුලකුරුවලින් හැඳින්වෙන නම : ..........
3. ජාතික හැඳුනුම්පත් අංකය : ..........
4. දැනට සේවය කරන දෙපාර්තමේන්තුව හා එහි ලිපිනය : ..........
   ..........
   වර්තමාන සේවා ස්ථානය හා එහි ලිපිනය : ..........
   ..........
5. සේවය ස්ථිර කරන ලද දිනය : ..........
6. විශ්‍රාමික ද යන වග : .......... විශ්‍රාම ලැබූ දිනය : ..........
7. දුරකතන අංකය : රාජකාරි - .......... පෞද්ගලික - ..........
8. WhatsApp අංකය : ..........
9. Email ලිපිනය : ..........
10. ස්ත්‍රී / පුරුෂ භාවය : ..........
11. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද දිනය : ..........
12. බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) I ශ්‍රේණියේ තනතුරට පත් කරන ලද දිනය : ..........
    පත්වීම් ලිපියේ යොමු අංකය හා දිනය : ..........
13. පහත වගුවෙහි සඳහන් දිනවලට බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) I ශ්‍රේණියේ සේවා කාලය :

| *දිනය* | *සේවා කාලය* | | |
|---|---|---|---|
| 2018.12.31 | *අවුරුදු* | *මාස* | *දින* |
| 2019.12.31 | | | |

14. තෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන ලද දිනය : ..........................................................................................

15. *වෘත්තීය සුදුසුකම් :*

| *අනු අංකය* | *පුහුණුව* | *පුහුණු සහතිකය* | *වලංගු දිනය* |
|---|---|---|---|
| 01 | සිවිල් ක්ෂේත්‍රයට අදාළව මාස 06ක් හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලා සහතික | | |
| 02 | සිවිල් ක්ෂේත්‍රයට අදාළව මාස 06ට අඩු ඩිප්ලෝමා පාඨමාලා සහතික | | |

16. තොරතුරු තාක්ෂණ පාඨමාලා / පරිගණක පාඨමාලා .-

| *අනු අංකය* | *පුහුණුව* | *පුහුණු සහතිකය* | *වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |

17. ඉටු කරන ලද ව්‍යාපෘති හා ඉටු කිරීමේදී පැවති ගැටළු හා ඒවාට ලබාදුන් විසඳුම්

(ඒ ඒ වර්ෂවලට අදාළ කරන ලද ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කෙටියෙන් දක්වන්න.)

| *වර්ෂය* | *ඉටු කරන ලද ව්‍යාපෘතිය* | *ව්‍යාපෘතිය සාර්ථකව ඉටු කර ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලැබී ඇත* | *ඉටු කිරීමේ දී පැවති ගැටළු* | *ගැටළු වලට ලබාදුන් විසඳුම්* |
|---|---|---|---|---|
| | | | | |
| 2019 | | | | |
| 2020 | | | | |

18. සිවිල් ඉදිකිරීම් හා නඩත්තු සේවා කටයුතු ඉටු කිරීමේ දී දක්වන ලද සක්‍රිය දායකත්වය පිළිබඳ විස්තර :

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

19. 2018.12.31 හා 2019.12.31 (අදාළ නොවන වර්ෂ තනි ඉරකින් කපන්න) ට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත / නැත

19.1 වැටුප් වර්ධක උපයා ගෙන ඇත / නැත :...................................................

19.2 විනය දඬුවම් ලබා ඇත / නැත :...................................................

වැටුප් වර්ධක උපයා ගෙන නැති නම් / විනය දඬුවම් ලබා ඇති නම් ඊට හේතු දක්වන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

20. පාලන චක්‍රලේඛ 04/2021 අනුව විනය දඬුවම් ලබා ඇත / නැත :...................................................................................

විනය දඬුවම් ලබා ඇති නම් ඊට හේතු දක්වන්න :...................................................................................

..........................................................................................................................................................

21. 2019.12.31 හා 2020.12.31 ( අදාළ නොවන වර්ෂ තනි ඉරකින් කපන්න) ට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් රහිත නිවාඩු ලබා ඇත / නැත :..........................................................................................

ඇත නම් ඊට හේතු දක්වන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

22. *අයදුම්කරුගේ සහතිකය :*

මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය බවත්, මෙම සම්මුඛ පරීක්ෂණය පිළිබඳව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.06.24 දිනැතිව අනුමත කරන ලද 2013.06.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ 10.3.3 ඡේදයට අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වෙමි. තවද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීති වලට සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත උසස් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.........................................................................
නිලධාරියාගේ අත්සන.

දිනය : ..........................

23. *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) I ශ්‍රේණියේ නිලධාරි / නිලධාරිනි ..................... ...................................................................................... මහතා / මහත්මිය ........................................... දින සිට මෙම කාර්යලයේ සේවය කරන බවත්, ..................................................... දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්) I ශ්‍රේණියට උසස් වී ඇති බවත්, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.06.24 දිනැතිව අනුමත කරන ලද 2013.06.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ 10.3.3 ඡේදයට අනුව සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනට විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

දිනය : ..................................

.........................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

24. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :*

ඉහත නිර්දේශය හා එකඟ වෙමි / නොවෙමි.

.........................................................................
දිනය : ............................... දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

25. *අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :*

ඉහත නිර්දේශය සමග එකඟ වෙමි/නොවෙමි.

.........................................................................
දිනය : ............................... අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හ ානිල මුද්‍රාව.

26. *ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :*

ඉහත නිර්දේශය හා එකඟ වෙමි / නොවෙමි.

.........................................................................
ප්‍රධාන ලේකම් (බ.ප.) ගේ අත්සන හා නිලමුද්‍රාව.

දිනය : ...................................

09-71